# ගෞතම බුදුරජාණන් වහන්සේ අද්භූත දෙවියෙක්ද?

අඹගහගම සෝමකිත්ති හිමි

ගෞතම බුදුරජාණන්වහන්සේ මානව ඉතිහාසයේ එක්තරා අවධියක ජීවත් වූ මනුෂ්‍යයෙකි. මිනිස් ජීවිතයේ අත්දැකීම් වලින් යුක්ත වූ ඓතිහාසික පුද්ගලයෙකි. අද්භූත දෙවියෙකු විමුක්තිදායකයෙකු හෝ ගැලවුම්කාරයෙකු නොවූ උන්වහන්සේ මාර්ගෝපදේශකයෙකු වශයෙන්

"තුම්හෙහි හි කිච්චං ආතප්පං
අක්ඛාතාරො තථාගතා"

යනුවෙන් උන්වහන්සේ විසින් ම හඳුන්වා දී ඇත. බුදුරජාණන්වහන්සේ ඇලීම් බැඳීම් ගැටීම් මුවාවීම් වලින් යුතු සාමාන්‍ය මිනිස් මනසක් සහ ක්‍රියා කලාපයක් ද සහිත පුහුදුන් මිනිසාට සහමුලින්ම සමානය යන සාවද්‍ය මතයක් ගොඩනැගීම නොවේ. සාමන්‍ය පුහුදුන් මිනිසකුට වඩා ශ්‍රේෂ්ඨත්වයක් උන්වහන්සේ තුළ විය. උන්වහන්සේ උත්තරීතර මනුෂ්‍යයෙකු ලෙස හැඳින්විය හැකිය. සාමාන්‍ය මිනිසුන් අතර ජීවත් වූවත් අපවිත්‍ර කැලි කසළ පිරි මඩ සහිත වළක පිපි පියුමක් සේ එම අපවිත්‍ර දෑ වලින් තොරව ඉහළට පැන නැගී සුගන්ධත්වයෙන් හා පවිත්‍රත්වයෙන් යුතු වන්නා සේම උන්වහන්සේද සාමාන්‍ය ලෝකය සමග ගැටී ලෝක ධර්මතාවයන්ගේ නො ඇලී කල් ගෙවූහ.

උන්වහන්සේගේ ජීවිතයද මිනිස් අත්දැකීම් වලින් පරිපූර්ණ වූහ. "සො ඛො අහං භික්ඛවෙ අපරෙන සමයෙන දහරොච සමානො සුසුකාල කෙසො භද්‍රෙන යොබ්බනෙන සමන්නාගතො පඨමෙන වයසා අකාමකානං මාතා පිතුන්නං රුදන්තානං කෙස මස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජ්ජිං" 1

"මහණෙනි ඒ මම පසුකාලයෙහි ළදරුවූයෙමි. ඉතා කළු කෙස් ඇත්තෙමි. පළමු වන වයස වූ සොඳුරු යෞවනෙන් යුක්ත වූයෙමි. නොකැමති වූ කඳුළු පිරුණ මුහුණු ඇති මව් පියන් හඬද්දී කෙස් රැවුළු බා කහවත් හැඳ ගිහි ගෙයින් නික්ම පැවිද්දට පැමිණියෙමි."

මජ්ඣිම නිකායේ අරිය පරියේසන සූත්‍රයේ සඳහන් මෙයින් විස්තර වන්නේ ද සාමාන්‍ය පුද්ගලයෙකු කෙස් රැවුළු බා ගිහි බව අත්හැර පැවිදි වූ ආකාරයට සිදුහත් කුමරුද කෙස් රැවුළු බා ගිහි බව අත්හැර පැවිදි වූ බවක් මිස අද්භූත දෙවියකු හෝ බ්‍රහ්මයෙකු පැවිදි වූ අයුරු නොවේ. සිදුහත් කුමරුට ද සාමාන්‍ය පුද්ගලයෙකුට මෙන් ගිහි බව අත්හැර පැවිදිවීම සාධාරණ වූ බව මින් පැහැදිලිවේ. එහෙයින් මෙය දෙවියකු පිළිබඳ පුවතක් නොවිය යුතුය.

තමන් වහන්සේද බුදුවීමට පෙර ජාති ජරා මරණාදියෙන් පීඩිත වෙමින් ඒ පීඩිත වූ දේම ආශ්‍රය කළ බව අරිය පරියේසන සූත්‍රයෙන් විස්තරවේ. ගිහි ගෙයි විසූ සිදුහත් කුමරුගේ ජීවිතය කෙලෙස් බරින් යුතු මිනිස් පැවැත්මට සමාන විය. උන්වහන්සේ පැවිදිවීමෙන් පසු ආලාර කාලාම ආදීන් වෙත සත්‍යය සොයා ගියහ. එයින් පෙනෙන්නේ සත්‍යය සොයා තැන තැන ගිය තරුණයෙකු ගැන මිස අද්භූත දෙවියෙකු ගැන නොවේ.

සත්‍යය සොයා වෙහෙසුන උන්වහන්සේ උරුවෙල් දනව්වේදී කළ භයානක දුෂ්කර ක්‍රියාවේදී ක්‍රමයෙන් ආහාර ගැනීම අඩුකළ විට සිරුර ක්‍රමයෙන් දිරා ගොස් බඩ පිරිමදින විට පිටකොන්ද අසුවන බව සඳහන්වේ. සාමාන්‍ය මිනිසකු වුවත් ආහාර ගැනීම අඩුකළ විට ක්‍රමයෙන් ශරීරය කෙසඟවීම ස්වාභාවිකය. උන්වහන්සේ අද්භූත අතිමානුෂීය ගුණවලින් පිරි දෙවියෙකු නම් සාමාන්‍ය පොදු ජනතාවට බලපාන දේ උන්වහන්සේට බලපාන්නේ ද?

දිනක් සාරිපුත්‍ර හිමියන් අමතා කළ දේශනාවක් මජ්ඣිම නිකායේ මහා සීහනාද සූත්‍රයේ සඳහන් විස්තර එය තවදුරටත් පැහැදිලි කර දෙයි. සිදුහත් බෝධිසත්වයන් වහන්සේ බුද්ධත්වය ලැබීම යනු දේව වරමක් ලැබීම නොවේ. පුනර්ජීවනයක් පුනරුත්ථාපනයක් ලෙස එය හැඳින්විය හැකි නමුත් ඒ වනාහි දිව්‍යමය ප්‍රාග් අනුභූතියක් අද්භූත බලවේගයක් තමා වෙත ළඟාකර ගැනීමක නොවේ. 2

මිනිස් ලොව මිනිස් පියෙකුට දාව මවකගේ කුසින් බිහි වූ සිද්ධාර්ථ කුමරු ගෙවූ සුඛෝපභෝගී ජීවිතය ඉතා උසස් ලෙසින් ගතකර ඇත. එතුමන්ට අසීමිත සැප සම්පත් රජ ගෙදර වූහ. බුද්ධත්වයෙන් පසු උන්වහන්සේගේ ජීවිතය පිළිබඳව නොයෙක් තොරතුරු සූත්‍රවල සඳහන් වී ඇත. ලෙඩවීම, විඩාව කුසගින් උන්වහන්සේටත් ඇති වූහ. උන්වහන්සේ සරණවීමට අසරණයන් සොයා ගියහ. අදෘෂ්‍යමාන සර්වබලධාරී අද්භූත දෙවියන්ගෙන් පිහිටක් පැතිය යුත්තේ ද බමුණන්ගේ මාගීයෙනි. සියැසින් දැක ළඟට වී උන්වහන්සේගෙන් පිහිට පැතීමට සැමට අවසර තිබිණි. තවත් කෙනෙකු ලවා පිහිට පැතිය යුතු විය නැත.

සාමාන්‍ය මිනිස් ජීවිතයේදී හටගන්නා වූ ලෙඩ රෝග උන්වහන්සේට ද හටගත්හ. මහා පරිනිබ්බාණ සූත්‍රයේ සඳහන් වන පරිදි උන්වහන්සේ බේලුව ගමේදී ලෝහිත පක්කන්දිකා නම් මහත් භයානක රෝගාබාධයකට ගොදුරු වූහ. උන්වහන්සේට ද වෙහෙස විඩාව

ඇති විය. කුසිනාරාවට වැඩම කරන අතරතුරදී හතර පස් වතාවක්ම රුක් සෙවණේවල වැඩ හිඳ විඩා හැර වැඩම කළ බව සඳහන් වේ. සාමාන්‍ය මනුෂ්‍යයෙකු මෙන් උන්වහන්සේ ද ක්‍රමයෙන් වයසට ගොස් ගත රැළි වැටී ඡවි වර්ණය පවා වෙනස්වූ බව සඳහන්ව ඇත. උන්වහන්සේ ඇතැම් විට දේශනා කරමින් සිටි දේශනා පවා තවත් තෙරුන්වහන්සේ නමකට බාරකර තමන් වහන්සේට හටගත් වේදනාවක් නිසා ආරාමයට වැඩම කොට ඇති බව සඳහන්වේ. මේ සෑම දෙයකින්ම ඔප්පු වන්නේ සාමාන්‍ය මිනිසෙකුට ජීවිතයේදී දක්නට ලැබෙන සිදුවීම්ය. ඒ සෑම සිදුවීමක්ම බුදුරජාණන්වහන්සේට ද සාමාන්‍ය පුද්ගලයෙකුට මෙන්ම සාධාරණ විය. අද්භූත සර්වබලධාරී දෙවියෙකු වූවා නම් උන්වහන්සේට එවැනි දේ හමුවිය යුතු නොවේ.

බුදුරජාණන්වහන්සේ බේලුව ගමේදී ධර්මදේශනා කරණ විට ආනන්ද හිමියන් අමතා "අහං ඛො පන ආනන්ද එතරහි ජිණ්ණො වුද්ධො මහල්ලකො අද්ධගතො වයො අනුප්පත්තො ආසීතිකො මෙ වයො වත්තති සෙය්‍යථාපි ආනන්ද ජජ්ජර සකටං" "ආනන්ද මම දැන් මහලු වයස්ගත වූ අයකුගේ තත්ත්වයට පත්ව සිටිමි. මගේ වයස දැන් අසූ වියට ලඟා ඇත. දිරා ගිය පරණ ගැලක් යන්තම් පිළියම් කිරීමෙන් පවතින්නාක් මෙන් දැන් තථාගතයන්ගේ කය යැපෙයි" 4

සදාකාලික සර්වබලධාරී අද්භූත උතුමෙකු මෙම ප්‍රකාශනය තුළින් දක්ක නොහැක. ආනන්ද හිමියන් දිනක් බුදුරජුන් උදෑසන අව්රශ්මියෙන් ගත තවද්දී එතනට පැමිණි ආනන්ද හිමියන් "ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේගේ සෝභා සම්පන්න අද්භූත ඡවි වර්ණණය දැන් එතරම් පැහැපත් නැත. අග පසඟ දුබලව ගොස්ව ඇත. සිරුර වැහැරී ගොස් ය. පසිඳුරන්ගේ ද වෙනසක් වී ඇත." උන්වහන්සේ ද ස්වභාව ධර්මතාවයට ගොදුරු වී ඇති බව මින් පැහැදිලිවේ. මිනිසකු ලෙස උපත ලැබ මිනිසකු ලෙස දිවි ගෙවා මිනිසකු ලෙස පිරිනිවන් පෑහ.

ලෙඩවීම, මහලුවීම, මරණය, උන්වහන්සේට ද සාධාරණ විය. සාමාන්‍ය මිනිසුන් සමග එක්ව හිතවත්ව ජීවත් වූ බවට ඝටිකාරගේ කතා පුවත සාක්ෂි දරයි. කොසොල් රජතුමා බුදුරජුන් හමුවේ කළ ප්‍රකාශනයෙන් ඒ බව මනාකොට හෙළිවේ. "ස්වාමීනි භාග්‍යවතුන් වහන්සේද ක්ෂත්‍රියෙකි. මම ද ක්ෂත්‍රියෙක් වෙමි. භාග්‍යවතුන්වහන්සේද කොසොල් වැසියෙකි. මම ද කොසොල් වැසියෙක්මි. භාග්‍යවතුන්වහන්සේද අසූ හැවිරිදිය. මම ද අසූ හැවිරිදිය. 5 මජ්ඣිම නිකායේ ධම්ම චේතිය සූත්‍රයේ සඳහන් වන මෙයින් බුදුරජාණන්වහන්සේ හා මිනිසුන් අතර පැවති කිට්ටු සබඳතාවය හෙළිවේ.

උදාර ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකු වූ බුදුරජාණන්වහන්සේ සාමාන්‍ය මිනිසුන් සමග අටලෝ දහමට මුහුණ දෙමින් විසූහ. ගෞතම බුදුරජාණන්වහන්සේද සාමාන්‍ය පුද්ගල යන් මෙන්ම ලෝක ධර්මතාවයන්ට මුහුණ දුන් නිසා උන්වහන්සේ අද්භූත දෙවියෙකු නොවන බව පැහැදිලිය.

බුද්ධ පරිනිර්වාණයෙන් දෙවැනි සියවසේදී ඇති වූ සාසන අර්බුදයෙන් පසු බිහි වූ මහායානිකයෝ උන්වහන්සේ අද්භූත දිව්‍යමය උතුමෙකු ලෙස හඳුන්වා ඇත. අනන්ත ආයුෂ බලය උන්වහන්සේ සතු යැයි ඔවුහු සිතූහ. උන්වහන්සේ මිනිස් බවින් තොර කර අද්භූත අතිමානුෂීය උතුමෙකු ලෙස හඳුන්වා දුන්හ. උන්වහන්සේ ගැලවුම්කාරයෙකු විමුක්තිකාරයෙකු බවට පත්කරගෙන ඇත. උන්වහන්සේ මාර්ගෝපදේශකයකු මිස විමුක්තිදායකයකු නොවන බව බුද්ධ දේශනාවේ සඳහන්ව ඇත.

මහායාන - හීනයාන යනුවෙන් බෙදුන දෙපිලෙන් මහායානිකයෝ බුදුරජුන්ට දේවත්වය ආරෝපණය කර ඇති බව මහායාන ග්‍රන්ථ පරිශීලනයෙන් දක්ක හැක. බුදුරජාණන්වහන්සේට ධර්මකාය නිර්මාණකාය, සම්භෝගකාය යනුවෙන් තෙවදෑරුම් කායක් තිබුණ බව මහායානිකයෝ පෙන්වා දී ඇත. උන්වහන්සේ අද්භූත අතිමානුෂීයත්වයෙන් වර්ණනා කර ඇත. සාමාන්‍ය සිරුරක් තිබුන උන්වහන්සේට දේවත්වයක් ආරෝපණය කිරීමෙන් පසු අද්භූත දේවත්වයක් මත ගොඩනැගුන දහඅටරියන් අටරියන් වශයෙන් විශාල බුද්ධ ප්‍රතිමා ගොඩනැගූහ.

උන්වහන්සේ සදාකාලික දෙවියෙකු ලෙස හඳුන්වා දීමට කර ඇති නිර්මාණයකි. ඓතිහාසික පසුබිමක් නැති මවක් පියෙක් නැති අද්භූත දේවත්වයක් ආරෝපණය කර ඓතිහාසික පසුබිමක් මවක් පියෙක් ඇති බුදුරජුන්ට අද්භූත දේවත්වයක් ආරෝපණය කර උන්වහන්සේ ද අද්භූත දේවත්වයට පත්කර ඇත.

ගෞතම බුදුරජාණන් වහන්සේ මිනිසුන් අතර ජීවත් වූ ඓතිහාසික උතුම් මනුෂ්‍යයෙකි. මිනිසුන් ජීවත් වූ ශ්‍රේෂ්ඨ මනුෂ්‍යයෙකි. ගෞතම බුදුරජාණන් වහන්සේ අද්භූත දෙවියෙකු හෝ අතිමානුෂීය උතුමෙක් නොවේ.

| | | |
|---|---|---|
| 1 | මජ්ඣිම නිකාය | අරිය පරියේසන සූත්‍රය |
| 2 | " " | මහාසීහනාද " |
| 3 | දීඝ " | සංගීති " |
| 4 | " " | මහා පරිනිබ්බාණ " |
| 5 | මජ්ඣිම " | ධම්ම චේතිය " |